සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## කතෝලික ධර්මය - I

නම / විභාග අංකය : .............................................................................. කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**

**(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ගන්න.**

**(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (x) ලකුණ යොදන්න.**

**(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

01. අනෙකුත් මැවිලිවලට වඩා මනුෂ්‍යයා උසස් වන්නේ ඔහු තුළ ඇති
1. ආදරය හා කරුණාව නිසාය. 2. ආත්මය හෙවත් ස්ප්‍රිතුව නිසාය.
3. ප්‍රේමය හා විශ්වාසය නිසාය. 4. ප්‍රේමය හා පරිත්‍යාගය නිසාය.

02. පුරාණ ගිවිසුමට අයත් ප්‍රධාන දිවැසිවරු තිදෙනා වනුයේ,
1. ජෙරමියා, හොසියා හා එසකියෙල් ය. 2. මීකා, ජෙරමියා හා හොසියා ය.
3. එසකියෙල්, ජෙරමියා හා දානියෙල් ය. 4. යෙසායා, ජෙරමියා හා එසකියෙල් ය.

03. "සොබා දහම දෙවිඳුන් අපට දුන් විචිත්‍රවත් ප්‍රේමයේ හසුන් පතකි." මෙසේ ප්‍රකාශ කලේ,
1. අසීසියේ ප්‍රැන්සිස් තුමා ය. 2. ශා. ඉරනේයුස් තුමා ය.
3. රවීන්ද්‍රනාත් තාගෝර් තුමා ය. 4. ශා. ඉග්නේසියුස් ලොයලා තුමා ය.

04. "මේ මාගේ පුත්‍රයාණෝය. මේ මා තෝරාගත් තැනැත්තාණෝය. මොහුට සවන්දෙන්න." මෙම ප්‍රකාශනය හා සම්බන්ධ ජේසුතුමාගේ සිදුවීම නම්
1. අනාරූප විලාශවීමයි. 2. බව්තිස්ම ස්නාපනයයි.
3. අහස් නැගීමයි. 4. අන්තිම රාත්‍රී භෝජනයයි.

05. ක්‍රිස්තු ඉගැන්වීම අනුව ඔබට පීඩා කරන අය වෙනුවෙන් ඔබේ ප්‍රතිචාරය විය යුත්තේ,
1. ඔවුන්ට ආශිර්වාද කිරීමය. 2. ඔවුන්ගේ ඇසුරෙන් ඈත්වීමය.
3. ඔවුන් ගැන විමසිලිමත්ව සිටීමය. 4. ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීමය.

06. මරණය පිළිබඳව කිතුනු ආකල්පය විය යුත්තේ,
1. මෙලොවින් තාවකාලිකව සමුගැනීමයි. 2. සදාතන ජීවිතය වෙත පිවිසීමයි.
3. භෞමික ශරීරය විනාශ වී යාමයි. 4. සදාතන ජීවිතයේ ආරම්භයයි.

07. නව ගිවිසුමෙහි උත්තම පූජකයා වනුයේ,
1. මෙල්කිසදෙක්ය. 2. ස්නාවක ජොහානේය.
3. ක්‍රිස්තුන් වහන්සේය. 4. සකරියස් තුමාය.

08. සත්‍යයට සාක්ෂි දැරීම නිසා ශුද්ධවන්ත භාවයට ඔසවනු ලැබුවේ,
1. මැක්සිමිලියම් කෝල්බේ පියතුමාය. 2. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාය.
3. අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමාය. 4. දෙවන ජුවාම් පාවුළු පාප්තුමාය.

09. සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලැබීමෙන් අපි
   1. පාපයේ වහල්කමින් එතෙර වන්නෙමු.
   2. දේව සබඳතා යලි ගොඩනගා ගන්නෙමු.
   3. සිත් හැරීම තුළින් දෙවිඳුන්ට සමීප වන්නෙමු.
   4. ඉහත කාරණා සියල්ලම උරුමකර ගන්නෙමු.

10. සෑම ප්‍රසාද නිධානයකම අරමුණ වනුයේ,
   1. තම ජීවිතය වෙනස්කර ගැනීමට හැකිවීම යි.
   2. උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේ හමුවීම යි.
   3. දේව රාජ්‍යයේ සාක්ෂිකරුවන් බවට පත්වීම යි.
   4. ඇතුලාන්ත සිත් ශාන්තිය ලබා ගැනීම යි.

11. මිනිසා පූර්ණ තෘප්තියට පත්වන්නේ,
   1. දේව ප්‍රකාශන කියවීමෙනි.
   2. දෙවියන් හා සම්බන්ධවීමෙනි.
   3. දේව පණත් අනුව ජීවත්වීමෙනි.
   4. දේව මහිමය මෙලොව අත්දැකීමෙනි.

12. යන්ත්‍ර මන්ත්‍ර හා ගුරුකම් කෙරෙහි විශ්වාසය තැබීම .......................... විරුද්ධවේ. හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,
   1. පළමු පණතට
   2. තුන්වන පණතට
   3. දෙවන පණතට
   4. පස්වන පණතට

13. නිර්මල පැවැත්ම මගින් ජීවිතයේ අගය වැඩිදියුණු කර ගැනීමට නම්,
   1. සමාජයෙන් හැකිතරම් ඈත්වී ජීවත් විය යුතුය.
   2. හුදකලාව යාච්ඤාවේ හා භාවනාවේ නිරත විය යුතුය.
   3. ආත්මික භක්ති අභ්‍යාසයන්හි නිරත විය යුතුය.
   4. ආත්ම දමනයෙන් යුතු පිරිසිදු ජීවිතයක් ගතකල යුතුය.

14. කතෝලික සභාවේ ධර්මෝපදේශය ග්‍රන්ථයෙහි දක්වෙන පරිදි සාන්ත සභාව නමැති ප්‍රසාද නිධානය පූර්ණව විද්‍යාමාන වනුයේ,
   1. ජනවන්දනාව තුළය.
   2. දිව්‍යසත්ප්‍රසාදය තුළය.
   3. යාම යැදුම තුළය.
   4. පොදු යාච්ඤාව තුළය.

15. අන්තිම රාත්‍රි භෝජනයේදී ක්‍රිස්තුන් වහන්සේ පූජකවරය ස්ථාපිත කරන ලද්දේ
   1. කිතුනු ජනතාවට සේවය කිරීම සඳහාය.
   2. දේව සේවය ඉටුකරලීමට පිරිසක් පත්කරගනු සඳහාය.
   3. තමන් සතු බලය අන් අය හා බෙදාගනු සඳහාය.
   4. පූජකවරය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාය.

16. සෑම ජනවන්දනාවක්ම .................................. පිදෙන යාච්ඤාවකි. හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,
   1. දෙමාපියන්ට
   2. ශුද්ධවන්තයන්ට
   3. දෙවියන් වහන්සේට
   4. ශුද්ධවූ සභාවට

17. ධෛර්යමත්ව හා නොකඩවා යාච්ඤා කිරීමේ අගය පෙන්වාදෙන උපමා කථාවකි.
   1. පරිසිවරයා හා අයකැමියා
   2. මහ රෑ පූප ඉල්ලූ මිත්‍රයා
   3. යහපත් සමරිතානු වරයා
   4. මහා මංගල භෝජනය

18. ඊශ්‍රායෙල් ජනතාව දෙවියන්ට කළ ඉතා බලවත් සාමූහික යැදුමක් පිළිබඳව සඳහන් වන්නේ,
   1. ජූදිත්ගේ පොතේය.
   2. තෝබිත්ගේ පොතේය.
   3. එස්තර්ගේ පොතේය.
   4. I සාමුවෙල් පොතේය.

19. රෝම ලිපිය තුළින් ශු. පාවුළු තුමා යාච්ඤාව හඳුන්වන්නේ .............................. දීමනාවක් ලෙසය. හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,
1. විශ්වාසයේ  2. බලාපොරොත්තුවේ
3. ශුද්ධාත්මයාණන්ගේ  4. දේව ප්‍රේමයේ

20. ක්‍රිස්තුන් වහන්සේ තම දේවපුත්‍ර භාවය පැහැදිලිවම සඳහන් කළ එකම අවස්ථාව වනුයේ
1. උත්තම පූජක යාච්ඤාවේදීය.
2. පාළුකරයේ පරීක්ෂාවනට මුහුණදීමේදීය.
3. පිලාත් ඉදිරියේ විනිශ්චයට ලක්වීමේදීය.
4. ගෙත්සමෙනි මල් උයනේ අත්අඩංගුවට ගත්විටදීය.

21. තෙරේසා මවුතුමිය විසින් ආරම්භ කළ පැවිදි නිකාය වන්නේ
1. සුරදූතික පැවිදි නිකාය.  2. ලොරෙට්ටෝ නිකාය.
3. දයාවේ සොයුරියන්ගේ නිකාය.  4. ශුද්ධ වූ පවුලේ නිකාය.

22. ප්‍රේමයෙහි පවතින තැනැත්තා
1. කිසි දිනක මරණයට පත්නොවන්නේය.
2. දෙවියන් වහන්සේගේ කරුණාව ලබන්නේය.
3. ලෝකයාගේ ගෞරවය හා ප්‍රශංසාව ලබන්නේය.
4. දෙවියන් වහන්සේ තුළ ජීවත්වන්නේය.

23. පහත සඳහන් ක්‍රියා අතුරින් ශාරීරික පුණ්‍ය ක්‍රියාවක් වන්නේ,
1. අඥාණයන්ට ඉගැන්වීමය.  2. වරදට කමා කිරීමය.
3. මළවුන් වැළලීමය.  4. පව්වුවූවන් පාපයෙන් හැරවීමය.

24. දේශය උරුමකර ගැනීමේ භාග්‍යය අයත්වන්නේ,
1. නිහතමානී ගුණ ඇත්තන්ටය.  2. නිර්මල සිත් ඇත්තන්ටය.
3. බැගෑසිතින් දෙව්සරණ පතන්නන්ටය.  4. යුක්තිය උදෙසා පීඩා විඳින්නන්ටය.

25. හෘදය සාක්ෂියට අනුකූලව අවංකව කටයුතු කරන විට
1. ගෞරවය සහ කීර්තිය ලැබේ.  2. ප්‍රීතිය හා චිත්ත සාමය ලැබේ.
3. මෙලොව අපට අවශ්‍ය සියළුම දේ ලැබේ.  4. තුති පැසසුම් හා ජනප්‍රියත්වය ලැබේ.

26. ක්‍රියාකාරි ඇදහිල්ල තුළ ජීවත්වන පුද්ගලයෙකුගේ ලක්ෂණයකි.
1. නිතර දේවස්ථානය වෙත යාම  2. නිතර ජපමාලය උච්චාරණය කිරීම
3. දේව කැමැත්තට සම්පූර්ණයෙන් නතුවීම  4. සමාජසේවා කටයුතු වල නිරතවීම

- දේව පණත් කඩ කිරීම සම්බන්ධව නිමාලි ඉදිරිපත් කළ කරුණු කිහිපයක් පහත දක්වේ.
A - විවාහ මංගල්‍ය වලදී නැකැත් අනුව ක්‍රියා කිරීම
B - තම ශරීර සෞඛ්‍යය ගැන සැලකිලිමත් නොවීම
C - අනුන්ගේ අදහස් තමන්ගේ ලෙස ප්‍රකාශ කිරීම
D - ඉරුදින පූජාවට නොගොස් උපකාරක පංති වලට සහභාගිවීම
E - අසභ්‍ය වචන කථා කිරීම
F - තම මිතුරාට විරුද්ධව බොරු චෝදනා නැගීම

ඉහත තොරතුරු උපයෝගි කරගෙන **ප්‍රශ්න අංක 27, 28 හා 29** ට පිළිතුරු සපයන්න.

27. එකම දෙවියන් වහන්සේට විරුද්ධව කිතුණුවා කටයුතු කරන අවස්ථා දෙකකි.
1. A හා D ය.  2. B හා C ය.  3. A හා E ය.  4. E හා F ය.

28. හත්වන හා අටවන පණත් කඩවන ක්‍රියාමාර්ග දෙකකි.
1. C හා D ය.  2. B හා E ය.  3. C හා F ය.  4. D හා F ය.

29. පස්වන හා හයවන පණත්වලට විරුද්ධව ක්‍රියාකරන අවස්ථා දෙකකි.
   1. C හා D ය.   2. B හා E ය.   3. D හා F ය.   4. E හා F ය.

30. සමගිවීමේ ප්‍රසාද නිධානය නිසි ලෙස ලබා ගැනීමට නම් ඉටුකළ යුතු වැදගත්ම ක්‍රියාව වනුයේ,
   1. පව් සිහිකිරීම.   2. පියතුමාට පව්කීම.   3. මනස්ථාපනය.   4. දඩුවම් ඉටුකිරීම.

31. ශ්‍රාවකයන්ගේ පාද සේදීම තුළින් ජේසුස් වහන්සේ අපට තහවුරු කරනුයේ,
   1. වගකීම් ඉටුකළ යුතු බවය.
   2. නායකත්වය ගෙන කටයුතු කළ යුතු බවය.
   3. අන්‍යයන්ගෙන් සේවය ලබාගත යුතු බවය.
   4. නායකයා සේවකයා විය යුතු බවය.

32. "යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජීවත්වීමට නොදනී." මෙසේ පවසන ලද්දේ
   1. ශුද්ධවූ ජෝන් ක්‍රිසොස්තම් තුමාය.   2. ශුද්ධවූ අගුස්තීනු තුමාය.
   3. ශුද්ධවූ බෙනදික් තුමාය.   4. ශුද්ධවූ අම්බ්‍රෝස් තුමාය.

33. විවාහයේ පරමාර්ථ වනුයේ,
   1. එකිනෙකා තේරුම් ගනිමින් ජීවත් වීමය.   2. එකිනෙකාට විශ්වාසවන්ත වීමය.
   3. වෛවාහික ප්‍රේමය හා දරුවන් ලැබීමය.   4. අන්‍යෝන්‍ය ආදරයෙන් ජීවත් වීමය.

34. "වචනය තෙමේද මාංශ වූනේය. අප සමගද වාසය කළේය." යන ප්‍රකාශනය තුළින් අපට සිහිපත් කර වන්නේ ජේසුස් වහන්සේගේ,
   1. පාද දෝවනයයි.   2. අහස් නැගීමයි.
   3. උපත ලැබීමයි.   4. මිනිසත් බව ගැනීමයි.

35. ඉරුදින දිව්‍ය පූජාවේ කියවීම් හා දේශනයට සවන් දීමේ වැදගත්කම පෙන්වා දෙන උපමා කථාව වන්නේ,
   1. යහපත් එඬේරා පිළිබඳ උපමාව ය.   2. වපුරන්නා පිළිබඳ උපමාව ය.
   3. යුවතියන් දසදෙනා පිළිබඳ උපමාව ය.   4. තිරිඟු හා කිරිඳි පිළිබඳ උපමාව ය.

36. "දෙවියන් වහන්සේගේ රාජ්‍ය ප්‍රකාශ කරන පිණිසත්, රෝගීන් සුව කරන පිණිසත් ඔවුන් යැවූ සේක." (ලුක් 9/2) ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ,
   1. අපොස්තුළුවරුන් සේවය සඳහා පිටත්කර යැවීමට පෙර ය.
   2. ගලීල මුහුද අසළදී ශ්‍රාවකයන් තෝරා ගැනීමට පෙර ය.
   3. හැත්තෑදෙනා සේවය සඳහා පිටත්කර යැවීමට පෙර ය.
   4. අන්තිම රාත්‍රී භෝජනය සිදුකරනු ලැබීමට පෙර ය.

37. ක්‍රිස්තුන් වහන්සේ උගන්වා වදාළ යාච්ඤාව
   1. උත්තම පූජක යාච්ඤාව යි.   2. ස්වාමිවාක් ආරාධනාව යි.
   3. රාත්‍රී ආරාධනාව යි.   4. උදය ආරාධනාව යි.

38. ලක්දිව කතෝලික සාහිත්‍යයේ පියා ලෙස හඳුන්වන්නේ
   1. ගරු මර්සලින් ජයකොඩි පියතුමා ය.   2. ගරු මොසැසි පෙරේරා පියතුමා ය.
   3. ගරු ජාකොමෙ ගොන්සාල්වෙස් පියතුමා ය.   4. ගරු දොන් පීටර් පියතුමා ය.

39. "ගායනය යනු දෙවරක් යැදීමකි." යනුවෙන් ප්‍රකාශ කළේ
   1. ශු. අගුස්තීනු මුනිතුමාය.   2. ශු. ජෝන් ක්‍රිසොස්තම් මුනිතුමාය.
   3. ශු. අම්බ්‍රෝස් මුනිතුමාය.   4. ශු. ජස්ටින් මුනිතුමාය.

40. ප්‍රමාණයට වඩා මිල මුදල් ඉපයීම නොකළ යුතුය. එසේවීමෙන් ඇතිවන අහිසි විපාකයකි.
   1. යහපත් මිතුරන් ඇතිවීම   2. නිරෝගිමත් ජීවිතයක් ගතකළ හැකිවීම
   3. ආගම දහම ඇදහීමට වේලාවක් නොමැතිවීම   4. කාලය නිසිලෙස යොදාගත හැකිවීම

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2012**

**11 - ශ්‍රේණිය**

09327

# කතෝලික ධර්මය - II

නම / විභාග අංකය : .......................................................................... කාලය පැය 02 යි

- **පළමුවන ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1. 1. මිනිසා තුළ පවතින දේව සමානකමේ ලක්ෂණ **දෙකක්** ලියන්න.
   2. නවගිවිසුමෙහි සඳහන් ප්‍රශංසා ගීත **දෙකක්** නම් කරන්න.
   3. කතෝලික විවාහයට ඇති බාධා **දෙකක්** ලියා දක්වන්න.
   4. සමාජ සේවයේ ප්‍රසාද නිධාන **දෙක** නම් කරන්න.
   5. ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලය අනුමත කර ඇති ණය මංගල්‍යයන් **දෙකක්** ලියන්න.
   6. නිරන්තර යාච්ඤාවේ යෙදීමට ඇති බාධා **දෙකක්** පෙන්වා දෙන්න.
   7. ආශිර්වාදකාර බන්ධනය තුළ විවාහක යුවළ බැඳෙන පොරොන්දු **දෙකක්** ලියන්න.
   8. යෙසායා දිවැසිවරයා ඉදිරිපත් කරන දුක්විඳින සේවකයා සතු ලක්ෂණ **දෙකක්** දක්වන්න.
   9. භාග්‍යයන් පිළිබඳව සඳහන් වන නව ගිවිසුමේ පොත් **දෙක** නම් කරන්න.
   10. ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළින් බිහිවූ පැවිදි නිකායන් **දෙකක්** නම් කරන්න.

2. 1. මිනිසා උතුම්ම මැවිල්ල වීමට හේතු දෙකක් දක්වන්න.
   2. නූතන තාක්ෂණය යොදා ගැනීමේදී සැලකිලිමත් වියයුතු කරුණු තුනක් පෙන්වා දෙන්න.
   3. "නිවැරදි හෘදය සාක්ෂිය මිනිසාගේ යහපැවැත්මට හේතු වේ." මෙය සනාථ කිරීමට කරුණු පහක් දක්වන්න.

3. 1. දෙවියන් වහන්සේ මිනිසා සමඟ ගිවිසුමෙන් බැඳුණු අවස්ථා දෙකක් දක්වන්න.
   2. පුරාණ ගිවිසුම තුළ දිවැසිවරුනට පැවරුණු ප්‍රධාන කාර්යයන් තුනක් ලියන්න.
   3. විවාහය ගිවිසුමකි. ඒ අනුව ස්වාමිපුරුෂයා හා භාර්යාව සතු යුතුකම් පහක් පෙන්වා දෙන්න.

4. 1. යාච්ඤා කිරීම පිළිබඳව ජේසුස් වහන්සේ උගන්වා වදාළ උපමා කථා දෙකක් නම් කරන්න.
   2. ස්වාමිවාක් ආරාධනාවේ හා උත්තම පූජක යාච්ඤාවේ සඳහන් වන විශේෂ ලක්ෂණ තුනක් දක්වන්න.
   3. අසීසියේ ප්‍රැන්සිස් තුමාගේ යාච්ඤාවෙන් ඔබට ඉගෙන ගත හැකි විශේෂ ගුණාංග පහක් පෙන්වා දෙන්න.

5. 1. මුල් කිතුණු සභාවේ ලක්‍ෂණ දෙකක් ලියන්න.

   2. ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුළුවරුන් දොළොස් දෙනා පිටත්කර යැවීමට පෙර දුන් විශේෂ බලතල තුන නම් කරන්න.

   3. ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ පොදු පූජකවරය තුළින් ඔබට කළහැකි සේවාවන් පහක් ලියන්න.

6. 1. හත්වන පණතට විරුද්ධව ඔබ ක්‍රියා කරන අවස්ථා දෙකක් ලියන්න.

   2. අපට සාධාරණව වස්තුව ලබාගත හැකි අවස්ථා තුනක් ලියන්න.

   3. අපට ලැබී ඇති වස්තුව (ධනය) පරිහරණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පහක් දක්වන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

   (i) පෘතුගීසි සමයේ ධර්මදූතවරුන්ගේ සේවය

   (ii) මීසම තුල පූජාප්‍රසාදි තුමාගේ සේවය

   (iii) නව ආදම් වූ ක්‍රිස්තුන් වහන්සේ

   (iv) ස්වර්ග රාජ්‍යය වෙත මඟ දක්වන භාග්‍යයන්

   (v) රෝගීන්ගේ ආලේපනය තුළින් රෝගියාට අත්වන ප්‍රතිඵල